# කුලියාපිටිය නගර සභාව

## 2027 වර්ෂයට සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම

01.කුලියාපිටිය නගර සභාවට අවශ්‍ය පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ , ද්‍රව්‍ය , උපකරණ හා සේවාවන් සැපයීම සඳහා අපේක්ෂා කරනු ලබන සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම වෙනුවෙන් අයදුම්පත්‍ර පහත සඳහන් කොන්දේසි වලට යටත්ව ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ.

I. ලියාපදිංචිය සඳහා අයදුම්පත් 2026.10.19 දින සිට 2026.11.27 දින දක්වා කාර්යාල දිනවල පෙ.ව 9.00 සිට ප.ව 2.30 තෙක් ගෙනවිත් භාර දීමට හෝ **ලේකම් , නගර සභාව , කුලියාපිටිය** නමට ලියාපදිංචි තැපැල් හෝ කුරියර් සේවා මඟින් ද එවිය හැක.

II. ලියාපදිංචිය සඳහා අය කරනු උපලේඛනයේ සඳහන් ගාස්තු, නගර සභාවේ මුදල් අයකැමි වෙත ගෙවිය හැක.(චෙක්පත් මඟින් ගෙවීම් කරන්නේ නම් **"ලේකම් , නගර සභාව , කුලියාපිටිය"** නමට යොමු කළ යුතු ය.)

III. ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කළ යුතු ලේඛන - **අයදුම්පත්‍රය සහ ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපත**

IV. ලියාපදිංචි කිරීම සම්බන්ධ වැඩි විස්තර - කාර්යාල වේලාවන් තුළ සැපයුම් විෂයය භාර නිලධාරී මඟින් හෝ www.kuliyapitiya.uc.gov.lk වෙබ් අඩවිය මඟින් ලබා ගත හැක.

V. ලියාපදිංචි වන සියලු සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් **දින 30ක ඈය පදනම මත භාණ්ඩ හා සේවා සැපයිය යුතු ය.**

VI. මිල ගණන් කැඳවීමේ දී ඉදිරිපත් කරනු ලබන කොන්දේසි හා පිරිවිතරවලට අනුකූලව මිල ගණන් ඉදිරිපත් කිරීම සැපයුම්කරුවන්ගේ සහ කොන්ත්‍රාත්කරුවන්ගේ වගකීමකි.

VII. ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් සහ කොන්ත්‍රාත්කරුවන්ගෙන් මිල ගණන් කැඳවනු ලබන අතර ප්‍රමාණවත් තරගකාරීත්වයක් නොමැති අවස්ථාවක ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් බැහැරව භාණ්ඩ හා සේවා සපයා ගැනීමේ අයිතිය කුලියාපිටිය නගර සභාව සතු වේ.

VIII. භාණ්ඩ හා සේවා කොන්ත්‍රාත් සැපයීමේ දී රජයේ අනුමත බදු වර්ග හා කොන්දේසිවලට හා කුලියාපිටිය නගර සභාවේ නීති රීති වලට එකඟ විය යුතු ය.

IX. මිල ගණන් ඉදිරිපත් කරන දින සිට සාමාන්‍යයෙන් අවම දින 49ක කාලයක් තුළ මිල ගණන් නොවෙනස්ව ස්ථාවරව තැබිය යුතු ය.

X. මිළ ගණන් කැඳවීමේදී ඉදිරිපත් කරන කොන්දේසි නොසලකා හරින, කලට වේලාවට භාණ්ඩ සැපයීමට අපොහොසත් වන සහ ඇණවුමේ සඳහන් විස්තර සහ පිරිවිතරවලට අනුකූල මනා තත්ත්වයෙන් යුතු භාණ්ඩ සැපයීම පැහැර හරිනු ලබන සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් අසාදු ලේඛනගත කිරීමට කටයුතු කරනු ලැබේ.

XI. මිල කැඳවීමේ දී නම් කරන ලද භාණ්ඩ අදාළ ස්ථානය වෙත ප්‍රවාහනය කර භාර දීම දක්වා වගකීම දැරිය යුතුයි.

**02. ලියාපදිංචි කිරීම සම්බන්ධ අවසාන තීරණය කුලියාපිටිය නගර සභාවේ මහ සභාව සතු වේ.**

ඩබ්.පී. ගාමිණී කරුණාරත්න
සභාපති
කුලියාපිටිය නගර සභාව
2026.10.16

**දුරකථන අංක-037-4947850 / 037-2281275** **ෆැක්ස් -037-2281114**
**ඊ-මේල් -** kuliyauc@gmail.com **වෙබ් -** www.kuliyapitiya.uc.gov.lk

# <u>උපලේඛනය</u>

| අනු අංකය | සැපයුම් හා සේවා | ලියාපදිංචි කිරීමේ ගාස්තු (රු) 18% Vat බදු සමඟ |
|---|---|---|
| 1. | ගිනි නිවන උපකරණ සැපයීම , සේවා කිරීම , නැවත පිරවීම | 1770/- |
| 2. | වානේ , ප්ලාස්ටික් සහ දැව කාර්යාල උපකරණ සැපයීම | 1770/- |
| 3. | මුද්‍රණ කටයුතු (කාර්යාල ලේඛන සහ උප පත්‍රිකා)<br>**- කුලියාපිටිය නගර සභා බල ප්‍රදේශය තුළ** | 1770/- |
| 4. | සනීපාරක්ෂක උපකරණ සැපයීම (අත් වැසුම්, ගම් බූට්ස්, සබන්, විෂබීජ නාශක…) | 1770/- |
| 5. | ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම (**කළුගල්** ආශ්‍රිත නිෂ්පාදන, **ගඩොල්**, **වැලි, බොරළු**)<br>**- කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ පමණි** | 1770/- |
| 6. | විදුලි සහ ඉලෙක්ට්‍රොනික් උපකරණ සැපයීම | 1770/- |
| 7. | වීදි පහන් කට්ටල සැපයීම | 1770/- |
| 8. | ලිපිද්‍රව්‍ය සැපයීම | 1770/- |
| 9. | වාහන අමතර කොටස් සැපයීම | 1770/- |
| 10. | යන්ත්‍රෝපකරණ සහ කොටස් සැපයීම (තණකොළ කපන මැෂින්, ජෙනරේටර් ආදිය) | 1770/- |
| 11. | නගර සභාව සතු වාහන , ගොඩනැගිලි වැනි දේපල හා ජීවිත රක්ෂණය කිරීම | 1770/- |
| 12. | නගර සභාව සතු අංශ සඳහා ආරක්ෂක සේවාව සැපයීම (Security Services) | 1770/- |
| 13. | **වාහන සර්විස් කිරීම සහ අළුත්වැඩියා කිරීම** | |
| | i. වාහනවල විදුලි දෝෂ අලුත්වැඩියා කිරීම | 1770/- |
| | ii. වාහනවල කාර්මික දෝෂ අලුත්වැඩියා කිරීම | 1770/- |
| | iii. වාහන සේවා කිරීම (ලිහිසිකාරක ද්‍රව්‍ය ඇතුලු අමුද්‍රව්‍ය යොදා) | 1770/- |
| | iv. වාහන කුෂන් කිරීම , කාපට් කිරීම හා කැන්වස් ආවරණ සැපයීම | 1770/- |
| | v. වාහනවල වීල් එලයර්මන්ට් , සමබරතා පරීක්ෂාව හා ටයර් - ටියුබ් මාරු කිරීම | 1770/- |
| | vi. වාහන බඳ දිරුම් ටින්කර් කර තීන්ත ආලේප කිරීම | 1770/- |
| | vii. වාහන වායු සමීකරණ අලුත්වැඩියා කිරීම | 1770/- |
| | viii. ලියවන පට්ටල් වැඩ කිරීම (ලේත් මැෂින්) - **වයඹ පළාත තුළ පමණි** | 1770/- |
| 14. | නාම පුවරු, දැන්වීම් පුවරු සෑදීම සහ ඩිජිටල් බැනර් , ස්ටිකර් මුද්‍රණය කිරීම<br>**- (කුලියාපිටිය නගර සභා , ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ)** | 1770/- |
| 15. | පරිගණක සහ පරිගණක උපාංග සැපයීම | 1770/- |
| 16. | පරිගණක සහ මුද්‍රණ යන්ත්‍ර අළුත්වැඩියා සහ සේවා සැපයීම | 1770/- |
| 17. | වායු සමීකරණ යන්ත්‍ර අලුත්වැඩියාව | 1770/- |
| 18. | ජල නළ කර්මාන්තයට අවශ්‍ය උපකරණ සහ උපාංග සැපයීම (පීවීසී , පිත්තල , චීන වට්ටි උපකරණ ඇතුළුව) | 1770/- |
| 19. | වාහන ටයර් , ටියුබ් හා කොලර් සැපයීම සහ භාවිතා කරන ලද ටයර් නැවත පිරවීම | 1770/- |

| | | |
|---|---|---|
| 20. | වාහන හා යන්ත්‍ර සඳහා බැටරි සැපයීම | 1770/- |
| 21. | ජලය පිරිපහදු රසායනික ද්‍රව්‍ය සහ උපකරණ සැපයීම | 1770/- |
| 22. | කොන්ක්‍රීට් භාණ්ඩ සැපයීම (හියුම් පයිප්ප,කොන්ක්‍රීට් කණු, කම්බි කණු, ඉන්ටර්ලොක්, Readymix) - **වයඹ පළාත තුළ පමණි** | 1770/- |
| 23. | කෝලාස් සහ තාර සැපයීම | 1770/- |
| 24. | හාඩ්වෙයාර් අයිතම (සිමෙන්ති ඇතුලු) සහ තීන්ත සැපයීම<br>**- කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ පමණි** | 1770/- |
| 25. | නිල ඇඳුම් සඳහා රෙදි සහ සපත්තු සැපයීම (මුද්‍රණ සහිතව) | 1770/- |
| 26. | ජල මෝටර් ඇතුලු විදුලි උපකරණ අළුත්වැඩියා කිරීම | 1770/- |
| 27. | ආදාහනාගාරයේ ප්‍රයෝජනය සඳහා ගෑස් සැපයීම | 1770/- |
| 28. | ක්‍රීඩා භාණ්ඩ සැපයීම | 1770/- |
| 29. | ටෝනර් වර්ග සහ ඩුප්ලෝ තීන්ත සැපයීම | 1770/- |
| 30. | මුද්‍රණ යන්ත්‍ර , ඡායා පිටපත් යන්ත්‍ර , ඩුප්ලෝ යන්ත්‍ර , ෆැක්ස් යන්ත්‍ර , ඇඟිලි සළකුණු යන්ත්‍ර වැනි යන්ත්‍ර සැපයීම | 1770/- |
| 31. | වර්ණ අකුරු මුද්‍රිත පොහොර කවර සැපයීම (ඇතුලත පොලිතින් කවරය සහිත) | 1770/- |
| 32. | ඇලුමිනියම් අයිතම නිශ්පාදන කිරීම (දොරවල් , ජනේල වැනි) | 1770/- |
| 33. | ආරක්ෂිත කැමරා සැපයීම, සවි කිරීම සහ අලුත්වැඩියාව | 1770/- |
| 34. | අනාරක්ෂිත ගස්වල අතු කපා ඉවත් කිරීම | 1770/- |
| 35. | කෙටි ආහාර , උදේ / දිවා / රාත්‍රී ආහාර , පානීය ජලය ඇතුලු සංග්‍රහ ද්‍රව්‍ය සැපයීම **(කුලියාපිටිය නගර සභා , ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ)** | 1770/- |
| 36. | අබලි ද්‍රව්‍ය (පරණ යකඩ , පත්තර, සහරා, බෝතල්) ගැනුම්කරුවන් | 1770/- |
| 37. | පුටු , මේස , කබඩ් අලුත්වැඩියාව , පුටු විවීම, ගෘහ භාණ්ඩ කුෂන් දමා අලුත්වැඩියාව | 1770/- |
| 38. | මල් පැළ , එළවලු බීජ , පැළ / පළතුරු බීජ , පැළ / පොහොර , කෘෂි රසායනික ද්‍රව්‍ය ඇතුලු කෘෂි උපකරණ සැපයීම | 1770/- |
| 39. | යන්ත්‍ර උපකරණ මාර්ගයෙන් / මිනිස් ශ්‍රමයෙන් ළිං ඉසීම | 1770/- |
| 40. | බැකෝ යන්ත්‍ර , JCB යන්ත්‍ර කුලියට සැපයීම | 1770/- |
| 41. | ටයිල් , මෙසන් , වඩු වැඩ කිරීම | 1770/- |

**කොන්ත්‍රාත්කරුවන් (කර්මාන්තයේ ඇස්තමේන්තු හා වටිනාකම අනුව)**

| | | |
|---|---|---|
| 01 | රු.0-3,000,000 දක්වා (C9, ICTAD ලියාපදිංචි සහතිකයේ පිටපතක් ඉදිරිපත් කළ යුතුය) | 2360/- |
| 02 | රු.3,000,000 -7,000,000 දක්වා (C8, ICTAD ලියාපදිංචි සහතිකයේ පිටපතක් ඉදිරිපත් කළ යුතුය) | 3540/- |
| 03 | රු.7,000,000ට වැඩි (C7 සිට , ICTAD ලියාපදිංචි සහතිකයේ පිටපතක් ඉදිරිපත් කළ යුතුය) | 4130/- |

කුලියාපිටිය
නගර සභාව